**මාධ්‍ය නිවේදනය**

**කොළඹ, 2017 සැප්තැම්බර් 19**

Nestlé
Good Food, Good Life

# වැඩි කුළු බඩු සමඟ වැඩි රසයක්: මැගී නූඩ්ල්ස් දැන් කුළු බඩු රැසක් සමඟ වැඩි රසයකින් හා ගුණයකින්

නෙස්ලේ සමාගමේ කීර්තිමත් වෙළඳ නාමයක් වන මැගී, එහි කුකුළු මස් රසැති නූඩ්ල්ස් වල රසය තවත් වැඩි කිරීමට, කුළු බඩු වර්ග අටක් සහිතව නව නිෂ්පාදනයක් ලෙස නැවුම් මුහුණුවරකින් වෙළෙඳපොළට නිකුත් කර තිබේ. ව්‍යංජන සහ අනෙකුත් දේශීය ආහාර සඳහා ස්වාභාවික රසගන්වන වශයෙන් කුළුබඩු බහුලව භාවිතා කෙරෙන අප රටේ, මෙම නූඩ්ල්ස් නව හඳුන්වාදීම සඳහා මැගී ද ඒ හා සමාන පියවරක් අනුගමනය කර ඇත. ඒ අනුව එවැනි රසයක් එකතු කිරීමට, ශ්‍රී ලංකාවේ මුළුතැන් ගෙවල් වල සාම්ප්‍රදායිකව භාවිතා කරන එළවළු, කුළුබඩු වර්ග, මැගී නූඩ්ල්ස් නිෂ්පාදන පෙළට ද භාවිතා කර ඇත.

මෙය මැගී නිෂ්පාදන පෙළේ නව්‍යකරණ ක්‍රියාවලියේ අලුත්ම හඳුන්වාදීම වේ. දේශීය පාරිභෝගිකයන්ට ඔවුන්ගේ මුළුතැන් ගෙවල් වලින් ස්වභාවිකව සොයාගත හැකි හුරුපුරුදු අමුද්‍රව්‍යවලට ඇති කැමැත්තට ප්‍රතිචාර දැක්වීමක් ලෙස මෙසේ නිෂ්පාදන නව්‍යකරණ ක්‍රියාවලියකට පසුගිය වසරේ මැගී යොමුවිය. එය, වඩා රසවත් සහ ගුණදායී තෝරා ගැනීම් ලබා දෙන මැගී “Simply Good” වැඩසටහනේ එක් අංගයක් වන අතරම නෙස්ලේ සමාගමේ සෞඛ්‍යමත් හා සතුටුදායක ජීවන රටාවක් වෙනුවෙන් ගෝලීය වශයෙන් දක්වන කැපවීමටද සම්බන්ධ වේ.

නව කුකුළු මස් රසැති මැගී නූඩ්ල්ස්වල කොත්තමල්ලි, එනසාල්, කහ, සූදුරු, ගම්මිරිස් සාදික්කා හා උළුහාල් ආදී අපි හොඳින් හඳුනන කුළුබඩු වර්ග ඇතුළත් ය. දිනපතා ආහාර පිසීම පහසු කරන මැගී රස මුසු වල සුදුළූණු, මිරිස්, කහ, සූදුරු, සාදික්කා සහ උළුහාල් ආදිය අඩංගු විශේෂ කුළුබඩු මිශ්‍රණයක් අඩංගු වේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ ආහාර අංශයේ උප සභාපතිනී, ප්‍රියදර්ශිනී කරුණාරත්න මහත්මිය මෙසේ පැවසුවාය. ”මෙය මැගී සන්නාමයේ සුවිශේෂී අවස්ථාවක්. තමන් හොඳින්ම හඳුනන කුළුබඩු සහ එළවළු රසයෙන් මැගී නිෂ්පාදන වැඩි දියුණු කර තිබීම ගැන අපේ සියලූ පාරිභෝගික රසවතුන් සතුටට පත්වන බව විශ්වාසයි. අපි ඉදිරියටත් අපේ පාරිභෝගිකයන්ට රසයෙන් වගේම ගුණයෙනුත් පිරිපුන් ආහාර පිසීමේ විසඳුම් ලබා දෙන්නට අපි කටයුතු කරනවා”.

ශ්‍රී ලංකාව වැනි ක්ෂුද්‍ර පෝෂක වර්ග දෛනිකව නිසි පරිදි නොලැබෙන බහුතර ජනතාවක් සිටින රටක, ඔවුන්ට පෝෂ්‍ය පදාර්ථ වැඩිපුර ලබාදීමට සහ මනා පෝෂණයක් ලබා දීමට මැගී

දරන කැපවීමෙහි විශේෂ අංගයකි. ශ්‍රී ලංකාවේ පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේ නිපදවන මැගී නූඩ්ල්ස්, කැල්සියම්වලින් අනූන වන අතර, මැගී රස මුසු වල යකඩ අඩංගු වේ.

දිනෙන් දින සෞඛ්‍යයට මුල්තැනක් දෙන ආහාර රටාවකට අප ගමන් කරමින් සිටින නිසා "Simply Good" වැඩසටහන හරහා මැගී නිෂ්පාදනවල අන්තර්ගත ලුණු ප්‍රමාණයද නොකඩවා අඩු කිරීමට ඉදිරියට කටයුතු කරනු ඇත.

නව නිෂ්පාදන වෙනස්කම් සමඟ වඩා සෞඛ්‍යමත් හා සතුටුදායී ජීවන රටාවක් කරා ගමන් කිරීමට අවශ්‍ය ආහාර පුරුදු වලට මැගී "Simply Good" මගින් අනුබල ලබා දේ. ආහාර අසුරනවල හා අන්තර්ජාලයේ දැක්වෙන උපදෙස් හා කෑම වට්ටෝරු මගින් මෙන්ම මැගී රස චාරිකා ඉවුම් පිහුම් වැඩසටහන් ආදියෙන් ජනතාවට ගුණදායී සහ කාර්යක්ෂම ලෙස ආහාර පිසීමට අවශ්‍ය සහය ලබා දේ. මැගී ෆේස්බුක් පිටුව වන https://www.facebook.com/MAGGISriLanka/ මගින්, මැගී යොදාගනිමින් පහසුවෙන් සකස් කළහැකි කෑම වට්ටෝරු ඇතුළත් වේ. මේ නිසා තරුණ පරපුරට ද තම ආහාර පිළියෙල කරගනිමින් සමබර ආහාරවේලක් රසවිදීමේ අවස්ථාව ඉන් දිරිමත් කෙරේ.

"සමාගමක් ලෙස අපගේ අරමුණ වන්නේ, ජීවිතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සහ සෞඛ්‍ය සම්පන්න අනාගතයකට දායකවීමයි. අපි කරන දෙයට අර්ථයක් එක්වන්නේ ඒ මගිනුයි. රසයෙන් හා ගුණයෙන් පිරුණු ආහාරපාන ලබාදීම, අපගේ ප්‍රධාන අරමුණෙහි විශේෂ අංගයක්. අපි ඉදිරියේදීත් නැවුම් අමු ද්‍රව්‍ය සමඟින් ඉස්තරම් ආහාර පිළියෙල කරගැනීමට පාරිභෝගිකයින්ට සහය ලබාදීමට බලාපොරොත්තු වෙනවා මෙන්ම ඔවුන් වැඩි කොටසකට පෝෂණය වැඩියෙන් ලබාදීම සඳහා අපගේ සියලු පාර්ශවකරුවන් සමඟ කටයුතු කරනවා" යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මිය පැවසුවාය.